ජාතික ඛනිජ ප්‍රතිපත්තිය

(හයිඩ්‍රොකාබන හැර)

2023

පරිසර අමාත්‍යාංශය

ශ්‍රී ලංකාව

හැඳින්වීම

ඛනිජ යනු සීමිත සහ පුනර්ජනනීය නොවන ස්වභාවික සම්පතක් වන අතර වසර දහස් ගණනක මානව ශිෂ්ටාචාරය පුරා විවිධ වූ භාවිතයන් සඳහා අනිවාර්ය අමුද්‍රව්‍යක් විය. ඛනිජවල භාවිතය එක් වරකට පමණක් සීමා වන හෙයින්, ඛනිජ අනාගත පරපුරෙන් ණයට ගත් සම්පතක් ලෙස සැලකිය හැකිය. රටක ආර්ථික වර්ධනය තීරණය කිරීමේ ප්‍රධාන සාධකයක් ලෙස ද ඛනිජ සම්පත් හැඳින්විය හැකිය.

ඛනිජ සම්පත් පොදු උරුමයක් වන අතර රජය විසින් ජනතාව වෙනුවෙන් එම සම්පත්වල භාරකරු ලෙස ක්‍රියාකරන අතර රටේ සමස්ත ජනතාවගේ පොදු යහපත උදෙසා එම ඛනිජ සම්පතෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට රජය ක්‍රියා කරනු ලබයි. එබැවින්, ඛනිජ සම්පත මගින් උපරිම ආර්ථික ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා එහි ප්‍රශස්ත භාවිතය, කළමනාකරණය සහ නියාමනය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සකස් කිරීම අනිවාර්ය අවශ්‍යතාවයකි. ඛනිජ ගවේෂණ මගින් රටේ ඛනිජ සංචිත/ නිධි වල විභවය ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව වඩාත් නිවැරදි වශයෙන් හඳුනා ගැනීම ඛනිජ කර්මාන්තය කළමනාකරණය කිරීමේ මූලික සහ වැදගත්ම පියවර ලෙස සැලකිය හැකිය.

රටේ ඛනිජ විභවය නිසි ලෙස තක්සේරු කළ පසු, එම ඛනිජ සංචිත/ නිධි ඵලදායී මෙන්ම ප්‍රශස්ත ලෙස උපයෝජනයට අදාළ සුදුසු ඛනිජ නිස්සාරණ සම්මතයන් හඳුන්වා දෙන අතරම එහිදී පරිසරයට සිදුවන බලපෑම අවම වන ලෙසට පතල් කැණීම සිදුකිරීම සඳහා ප්‍රමුඛස්ථානය ලබා දේ. ශ්‍රී ලංකාවට ආවේනික වූ සුවිශේෂී මෙන්ම සංවේදී පාරිසරික තත්ත්වයක් පවතින බැවින් ඒ සඳහා විශේෂ සැලකිල්ලක් ලබා දෙමින්, ඛනිජ කර්මාන්තය සහ පරිසරය අතර නිසි තුලිතතාවයක් ඇති කිරීම සඳහා විධිමත් සහ නොලිහිල් ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයක් නිර්මාණය සඳහා මාර්ගෝපදේශනයක් සපයනු ලබයි. මෙම ප්‍රයත්නයේදී, ඛනිජ කර්මාන්තය ආශ්‍රිතව පූර්වයෙන් ලබාගත් අත්දැකීම් උපයෝගී කර ගැනීමට නියමිතය.

දැනට භාවිතාවන ජාතික ඛනිජ ප්‍රතිපත්තිය 1999 වසරේ දී කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය විසින් සම්පාදිතය. මෙරට පවතින සීමිත මෙන්ම තත්ත්වයෙන් උසස් ඛනිජ සම්පත් මගින් ඉහළ ආර්ථික ප්‍රතිලාභ ගෙන ඒමේ හැකියාව පැවතිය ද වර්තමානය වනවිට ඛනිජ වලින් සැලකිය යුතු ප්‍රමාණයක් අපනයනය කරනු ලබන්නේ අමුද්‍රව්‍යක් ලෙස හෝ එම ඛනිජ සඳහා ඌන අගය එකතු කිරීමක් සහිතවය. තවද, අපනයන ඛනිජ ද්‍රව්‍ය මගින් ලැබිය යුතු නියමිත මුදල් ප්‍රේෂණ රාජ්‍ය භාණ්ඩාගාරය වෙත ළඟා නොවන බවත් දේශීය ඛනිජ කර්මාන්ත මගින් රාජ්‍ය වෙත අයවිය යුතු රාජ්‍ය භාගය නිසි ලෙස නොලැබෙන බවත් හඳුනාගෙන ඇති හෙයින්, මෙම ගැටළු වලට පුළුල් පරාසයක විසඳුම් ලැබෙන ලෙසත් ඛනිජ මගින් රටට උපරිම ප්‍රතිලාභ ලැබෙන ලෙසටත් භාවිතයේ පවතින ඛනිජ ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය පැන නැගිණි.

ඉදිරිපත් කෙරෙන නව ජාතික ඛනිජ ප්‍රතිපත්තිය තුළ, පෙර පැවති ඛනිජ ප්‍රතිපත්තියෙහි සඳහන් කරුණු ඇතුළත්ව තිබුණද, වෙනස් වී ඇති වත්මන් තත්ත්වයන්ට සහ සමාජ ආර්ථික ඉදිරි දර්ශක වලට අනුගත වෙමින් රටේ ඛනිජ වල ‘‘නිසඟ වටිනාකම’’, ඛනිජවල ගුණාත්මක භාවය නිසි ලෙස තක්සේරු කිරීම, ඛනිජ සඳහා අගය එකතු කිරීම සහ ඛනිජ සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම පිළිබිඹු වන ආකාරයට මෙම නව ප්‍රතිපත්තිය නිර්මාණය වී ඇත. ඛනිජ අපනයනය තුළින් සිදුවන විදේශ මුදල් ප්‍රේෂණය අධීක්ෂණය සහ ඛනිජ කර්මාන්තය සඳහා අවහිරයක්ව පවතින ඉඩම් අයිතිය සහ ඛණිජ අයිතිය අතර අපැහැදිලිතාවය ද මෙම ප්‍රතිපත්තිය තුළින් විමසුමට ලක්කර ඇත. සාගර පතුලේ තැන්පත්ව පවතින ඛනිජ සම්පත් නිස්සාරණය සඳහා අවධානය යොමුවිය යුතු බව නව ප්‍රතිපත්තිය තුළින් අවධාරණය කර ඇත.

රටේ ඛනිජ සම්පත, ගවේෂණය, නිස්සාරණය, ප්‍රශස්ත ලෙස උපයෝජනය, කළමනාකරණය සහ නියාමනය සඳහා තීරණ ගැනීම සම්බන්ධයෙන් මහ පෙන්වන ප්‍රධාන ප්‍රතිපත්තිමය ප්‍රකාශනය ලෙස මෙම ඛනිජ ප්‍රතිපත්තිය හැඳින්විය හැකි අතර එය ප්‍රධාන මූලධර්ම 07 ක් යටතේ සාකච්ඡා කර ඇත. ඛනිජ ප්‍රතිපත්තියේ අරමුණු බිම් මට්ටමේ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන උපාය මාර්ග ද මෙම ප්‍රතිපත්තියේ දක්වා ඇති අතරම මෙමගින් ඛනිජ සම්බන්ධයෙන් අධිකාරිත්වයක් දරණ රාජ්‍ය ආයතන සඳහා ඉදිරි ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම උදෙසා මූලික පදනමක් ලෙස භාවිතා කළ හැකිය.

<u>විෂය පථය</u>

මෙම ජාතික ඛනිජ ප්‍රතිපත්තියේ විෂය පථය වන්නේ රටේ ඛනිජ සම්පත් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සහ නියාමනය සඳහා තීරණ ගැනීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශයක් සකස් කිරීමයි. හයිඩ්‍රොකාබන සංචිත සම්බන්ධයෙන් කළමනාකරණය සහ පරිපාලනය වෙනත් විෂය පථයකට අයත් බැවින් මෙම ජාතික ඛනිජ ප්‍රතිපත්තිය තුළින් හයිඩ්‍රොකාබන බැහැර කර ඇත.

ප්‍රතිපත්ති ඉලක්ක

මෙම ජාතික ඛනිජ ප්‍රතිපත්තියේ ඉලක්ක ලෙස, රටේ ඛනිජ සම්පත් ප්‍රශස්ත ලෙස උපයෝජනය මගින් රාජ්‍ය ආදායම වර්ධනය කිරීම, ඛනිජ ආශ්‍රිත අගය එකතු කිරීම ප්‍රවර්ධනය, අගය එකතු කරන ලද ඛනිජ අපනයන දිරිමත් කිරීම, ඛනිජ අපනයනයෙන් විදේශ විනිමය උපයා ගැනීම සහ එමගින් සිදුවන විදේශ මුදල් ප්‍රේෂණය අධීක්ෂණයට අදාළ කටයුතු සම්පාදනය, දේශීය පරිභෝජනය සඳහා අවශ්‍ය වන ඛනිජ ද්‍රව්‍ය දැරිය හැකි මිල ගණන් යටතේ ජනතාවට ලබා ගැනීමට කටයුතු සම්පාදනය, දැනට පවත්වාගෙන යනු ලබන සාම්ප්‍රදායික ඛනිජ කර්මාන්ත ආරක්ෂා වන පරිදි ඛනිජ සම්පත් නියාමනය සහ දේශීය ඛනිජ ආශ්‍රිත කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය අවහිරතාවයකින් තොරව සැපයීමට අවශ්‍ය කටයුතු සැලසීම දැක්විය හැකිය. මෙම සියළු ඉලක්ක සපුරාලීමේ දී පරිසරයට සිදුවන අනිසි බලපෑම අවම වන ලෙස කටයුතු කිරීමට බලාපොරොත්තු වේ.

ප්‍රතිපත්ති අරමුණු

1. ඛනිජ සම්පත් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සහ නියාමනය සඳහා දේශීය ඛනිජ විභවය නිසි ලෙස හඳුනා ගැනීමට ඛනිජ ගවේෂණ සිදුකිරීම සහ ඒවායේ ප්‍රමාණාත්මක සහ ගුණානාත්මක තත්ත්වයන් මත වටිනාකම තක්සේරු කිරීම.
2. ඛනිජ කැණීම් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරම්, ඛනිජ කර්මාන්තය සහ පරිසරය අතර තුල්‍යතාවය රැකෙන ලෙසින් ඵලදායී ආකාරයෙන් පවත්වා ගෙන යෑම.
3. රටට උපරිම ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයට ඛනිජ සඳහා අගය එකතු කිරීම සහ ඛනිජ ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය සඳහා දිරිගැන්වීම සහ ඒ සඳහා පහසුකම් සැලසීම.
4. ඛනිජ සඳහා ගවේෂණ කටයුතු සිදු කරන අවස්ථාවේ සිට ඛනිජ උපයෝගිතාවයෙන් නිෂ්පාදන සිදු කිරීමේ අවස්ථාව දක්වා සුදුසු රෙගුලාසි සහ සම්මත ප්‍රමිතීන් තුළින් ඛනිජ කර්මාන්තයේ සංවර්ධනය සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.

<u>අර්ථ දැක්වීම</u>

1. **ඛනිජ:** පෘථිවි පෘෂ්ඨය මතුපිට, මතුපිට ආසන්නයේ සහ/හෝ පෘථිවි පෘෂ්ඨය හෝ පොළොව අභ්‍යන්තරයේ සහ මුහුදු පත්ලේ ස්වභාවිකව ඇතිවන පවතින පෘථිවි ද්‍රව්‍ය වේ.

2. **රට:** ශ්‍රී ලංකාවට අයත් භූමි ප්‍රදේශය සහ එයට අයත් සාගර කලාපය (කලාපීය මුහුදු සහ යාබද කලාපය, අනන්‍ය ආර්ථික කලාපය සහ මහද්වීපික තටාකයේ දිගුව සහ මුහුදු පත්ල ඇතුළුව).

3. **ඛනිජ සඳහා අගය එකතු කිරීම:** මෙයින් අර්ථ නිරූපණය කරන්නේ, ගුණාත්මක තත්ත්වයන් පවත්වා ගනිමින් ඛනිජ කැණීම් කිරීම, පිරිපහදු කිරීම සහ අමුද්‍රව්‍ය පිරිසැකසුම් කිරීම වැනි විවිධ ශිල්පීය ක්‍රම තුළින් සහ/හෝ නිමි භාණ්ඩ නිෂ්පාදනය මගින් සහ/ හෝ වඩාත් පහසුකම් සහිත වෙළඳපොළක් සොයාගැනීම මගින් එම ඛනිජයේ පතල් වටිනාකමට සාපේක්ෂව වඩා ඉහළ ආර්ථික වටිනාකමක් ඇති තත්ත්වයට පරිවර්තනය කිරීමයි.

4. **ශූන්‍ය අපද්‍රව්‍ය:** ඛනිජ සංචිතයකින් ඉල්ලක්ක ගත ඛනිජය හෝ එම ඛනිජ වර්ග නිස්සාරණයෙන් පසුව ඉතිරිවන ද්‍රව්‍ය ද කිසියම් නිෂ්පාදන ක්‍රියාවලියක් සඳහා යොදා ගැනීමෙන් බැහැර කළයුතු අපද්‍රව්‍යය කිසිවක් ඉතුරු නොවන අවස්ථාවක් "ශූන්‍ය අපද්‍රව්‍ය" ලෙස හැඳින්වේ.

5. **පතල් කැණීම්කරු:** ඛනිජ ගවේෂණය, පතල් කැණීම, ප්‍රවාහනය සහ ඛනිජ සකස් කිරීම සිදු කරනු ලබන පුද්ගලික පාර්ශවයක් හෝ ආයතනයක් හෝ සංවිධානයකි.

6. **පතල් කැණීම:** යම් ඛනිජයක්, පෘථිවි පෘෂ්ඨය මතුපිට, මතුපිට ආසන්නයේ සහ/හෝ පෘථිවි පෘෂ්ඨය හෝ පොළොව අභ්‍යන්තරයේ සහ මුහුදු පත්ලේ පවතින ඛනිජ සංචිතයක් උකහා ගැනීම සඳහා සිදු කරනු ලබන කැණීමක් අදහස් වේ.

මූලධර්මය 1:

රජය තම බල ප්‍රදේශය තුළ පවතින/ තැන්පත්ව ඇති ඛනිජ සම්පත්වල විභවය දැනගත යුතුය.

ප්‍රකාශය:

තම බල ප්‍රදේශය තුළ පවතින/ තැන්පත්ව ඇති ඛනිජ සම්පත් පිළිබඳ තොරතුරු දැන ගැනීම රජය සතු කාර්යයභාරයක් වන අතරම එම තොරතුරු, ඛනිජ සම්පත් නිසි පරිදි කළමනාකරණය සහ නියාමනය සඳහා භාවිතා කිරීම රජයේ මූලික වගකීමක් වේ. තවද, ඛනිජ සම්පත් විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම සඳහා මෙම රැස් කරගත් තොරතුරු තවදුරටත් විශ්ලේෂණය කිරීම හා යාවත්කාලින කිරීම සඳහා සෑම ප්‍රයත්නයක්ම දැරිය යුතු වේ. ඒ සඳහා, ජාතික ආරක්ෂාවට බලපෑමක් සිදුවිය හැකි සහ පාරිසරික සංවේදී කලාප ලෙස හඳුනා ගත් කලාප හැර අනෙක් සියලුම රජයේ පාලනයට යටත් ප්‍රදේශ ආවරණය වන පරිදි ඛනිජ ගවේෂණ කාර්යයන් සිදු කිරීම සඳහා අවහිරතාවලින්/බාධාවලින් තොර ප්‍රවේශයන් සම්පාදනය කළ යුතුය.

උපාය මාර්ග:

(අ) ඛනිජ සම්පත් පිළිබඳ සවිස්තරාත්මක සහ නිරන්තරයෙන් යාවත්කාලින වන දත්ත/ තොරතුරු පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා ඛනිජ සංචිත/ නිධි පිළිබඳව විවිධ පාර්ශව, ආයතන, සංවිධාන හා සමාගම් යනාදිය තුළ ව්‍යාප්තව ඇති හෝ එක්රැස් කරන ලද දත්ත/ තොරතුරු ඒකාබද්ධ කිරීම.

i. ඛනිජ පිළිබඳ ඒකාබද්ධ දත්ත සමුදායක් නිර්මාණය කිරීම සඳහා රාජ්‍ය අංශයේ සහ පුද්ගලික ආයතන, සංවිධාන, සමාගම් යනාදියේ ඛනිජ පිළිබඳව පවතින සහ එක්රැස් කරන ලද දත්ත/ තොරතුරු රැස් කිරීම.

ii. ඛනිජ සම්පත් ආශ්‍රිතව සිදු කරනු ලබන සහ කරන ලද විවිධ වූ පර්යේෂණ සහ ගවේෂණයන් මගින් ලබා ගන්නා දත්ත/ තොරතුරු මෙම ඛනිජ සම්පත් පිළිබඳ දත්ත/ තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා යොදා ගැනීම.

(ආ) ශ්‍රී ලංකාව තුළ පවතින ඛනිජ සම්පත් ගවේෂණය සහ තක්සේරු කිරීම සඳහා ඛනිජ ගවේෂණ ක්‍රියාකාරකම් ඵලදායී ලෙස සිදු කිරීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණය සිදු කිරීම සහ රජය විසින් තම බල ප්‍රදේශය තුළ ක්‍රමානුකූල ඛනිජ ගවේෂණයන් සිදු කිරීම සඳහා හැකි සෑම අවස්ථාවකම ඉදිරිපත් වීම.

i. ශ්‍රී ලංකාව තුළ, ජාතික ආරක්ෂාවට බලපෑමක් සිදුවිය හැකි සහ පාරිසරික සංවේදී කලාප ලෙස හඳුනා ගත් කලාප හැර අනෙක් සියලුම රජයේ පාලනයට යටත් ප්‍රදේශ තුළ ඛනිජ ගවේෂණ කටයුතු සිදුකිරීම සඳහා අදාළ රාජ්‍ය ආයතන පහසුකම් සැලසිය යුතුය.

ii. තෙවන පාර්ශ්වයන් විසින් සිදු කරනු ලබන බනිජ ගවේෂණය කටයුතු ඇගයීමට ලක්කර බනිජ සම්පත් පිළිබඳ දත්ත/ තොරතුරු පද්ධතිය සඳහා අදාළ දත්ත ලබා ගැනීම.

iii. මූලික අරමුණ බනිජ ආශ්‍රිත දත්ත රැස් කිරීම නොවුනද, ශ්‍රී ලංකාව තුළ සිදු කරන මොනයම් ආකාරයේ සමීක්ෂණකදී හෝ ගවේෂණයකදී බනිජ ආශ්‍රිත දත්ත/ තොරතුරු උත්පාදනය/ සම්පාදනය වන්නේ නම්, එම දත්ත බනිජ සම්බන්ධයෙන් අධිකාරිත්වය දරණ රාජ්‍ය ආයතන සමඟ හුවමාරු කිරීම.

iv. ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාව තුළ මුහුදු පත්ලේ තැන්පත්ව පවතින බනිජ ගවේෂණය සඳහා අවශ්‍ය තාක්ෂණය සහ දැනුම දියුණු කිරීමට සුදුසු පියවර ගැනීම.

මූලධර්මය 2:

සමාජ-ආර්ථික සහ පාරිසරික ඉදිරි දර්ශක මත පදනම්ව සහ ඛනිජ ආශ්‍රිත කර්මාන්තයේ තිරසාරභාවය රැකෙන පරිදි, ජාතික, කලාපීය සහ ග්‍රාමීය ආර්ථිකයන් සඳහා ලැබෙන ප්‍රතිලාභයන් සැලකිල්ලට ගනිමින් පතල් කැණීම සම්බන්ධයෙන් තීරණ ගැනීම සිදු කළ යුතුය.

ප්‍රකාශය:

ඛනිජ වල අගය එකතු කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ නිසි තක්සේරුවක් සහ ආර්ථික ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරීමෙන් සහ ඛනිජ ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයන් සඳහා අමුද්‍රව්‍යක් ලෙස මෙම ඛනිජ සම්පත් භාවිතා කිරීමේ අවශ්‍යතාවය සහ උචිතභාවය පිළිබඳව නිසි අධ්‍යනයක් කිරීමෙන් අනතුරුව පමණක් පතල් කැණීම සඳහා සලකා බලනු ලැබේ. මෙම පතල් කැණීම් සිදු කිරීමේදී පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම වන පරිදි සහ කැණීම් කරනු ලබන පාර්ශවයන් සඳහා ඉහළ ආර්ථික ප්‍රතිලාභයක් උපයා ගත හැකි වන ආකාරයට කැණීම් පවත්වාගෙන යාම.

උපාය මාර්ග:

(අ) ඛනිජයක හෝ ඛනිජ වල ආර්ථික ශක්‍යතාව තක්සේරු කිරීමේදී,

i. ඛනිජ වර්ගයේ භාවිතය පිළිබඳ විස්තරාත්මක අධ්‍යනයක් සිදු කළ යුතු අතර සෑම අවස්ථාවක ඛනිජයේ වටිනාකම පිරිහීමට ලක්විය හැකි ඌන භාවිතා සඳහා අවස්ථාව වැළක්වීම.

ii. පතල් කැණීමේ ප්‍රමුඛතාවයන් ලබාදීමේ දී අදාළ ඛනිජයෙන් මෙරටට ලබාගත/ ළඟා කරගත හැකි ප්‍රශස්ත ආර්ථික ප්‍රතිලාභ ගැන සලකා බැලීම.

iii. යම්කිසි ඛනිජ සංචිතයකින්/ නිධියකින් ඛනිජ කැණීම පිළිබඳව තීරණ ගැනීමට පෙර, එම තැන්පතුවෙන් කැණීම් මගින් උකහාගත හැකි ඛනිජ ප්‍රමාණය සුදුසු සමීක්ෂණයකින්/ ඛනිජ ගවේෂණයකින් දැනගත යුතු වේ. නිශ්චිත කාල වකවානුහි දී ඛනිජ සංචිත/ නිධි මගින් කැණීම් කර ලබාගත හැකි ඛනිජ ප්‍රමාණය ගණනය කිරීම.

iv. පතල් කැණීම් සිදු කිරීමේදී ඛනිජ අමුද්‍රව්‍යවල සංශුද්ධතාවයට/ ගුණාත්මකභාවයට හානියක් නොවන පරිදි සහ පතල් කැණීමෙන් සිදුවිය හැකි පාරිසරික හානි අවම වන ආකාරයට භාවිතාකල හැකි නවීන තාක්ෂණික මෙවලම් සහ කාර්යක්ෂම කැණීම් ශිල්ප ක්‍රම භාවිතා කිරීම.

v. මුහුදු පතුලේ තැන්පත්ව පවතින ඛනිජ කැණීම් මගින් උකහා ගැනීම සඳහා සුදුසු තාක්ෂණික ක්‍රම, උපකරණ, මෙවලම් සහ දැනුම සංවර්ධනය කිරීම.

vi. ඛනිජ කැණීම් වල යෙදී සිටින පුද්ගලික සමාගම් සහ රාජ්‍ය ව්‍යවසායයන් ඛනිජ මගින් ලබා දිය යුතු නිසි ප්‍රතිලාභ රජයට ලබා නොදෙන අවස්ථාවන්හි එම ආයතන වලට එරෙහිව සුදුසු නීතිමය ක්‍රියාමාර්ග ගැනීම හෝ එවැනි ආයතනවල කැණීම් කටයුතු සීමා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

(ආ) ඛනිජ කැණීම මගින් පරිසරයට සිදුවන හානිය අවම වන පරිද්දෙන් සහ පතල් කැණීම සම්බන්ධයෙන් පනවන ලද කොන්දේසි වලට සහ අදාළ රෙගුලාසිවලට යටත්ව ඛනිජ පතල් පවත්වා ගැනීම.

i. ඛනිජ පතල් කැණීමක් සිදු කිරීමේදී අවට පරිසරයට සිදුවන බලපෑම ගණනය කිරීම සඳහා ඕනෑම ඛනිජ කැණීමක් ආරම්භ කිරීමට පෙර එම ස්ථානය සහ අවට ප්‍රදේශයන්හි පවතින පසුබිම් දත්ත (උදා : පාරිසරික සහ භූ විද්‍යාත්මක දත්ත) විශ්ලේෂණය කර පවතින මුල් තත්ත්වය නිර්ණය කිරීම.

ii. පතල් කැණීම් සහ පතල් කැණීම් ආශ්‍රිත ක්‍රියාකාරකම් නිසා පරිසරයට සහ ජන ජීවිත වලට අහිතකර බලපෑමක් සිදුවුවහොත්, පතල් කැණීම් සම්බන්ධයෙන් අධිකාරිත්වයක් දරණ රාජ්‍ය ආයතන, අනෙක් අදාළ (සිදු වී ඇති බලපෑම් පිළිබඳව කටයුතු කිරීමට වගකීම පවතින) රාජ්‍ය ආයතනවල සහාය ඇතිව එවැනි හානි තක්සේරු කළ යුතු වේ. තවද එම තක්සේරුවලින් අනතුරුව, හානි පූර්ණය වෙනුවෙන් අදාළ වන්දි බලපෑමට ලක් වූ පාර්ශ්වයන්ට ගෙවීම හා අදාළ දඩ මුදල් ගෙවීම එම පතල් කැණීම සිදු කරනු ලබන පුද්ගලයා, ආයතනය හෝ සංවිධානය (දූෂකයා ගෙවයි ප්‍රතිපත්තිය) විසින් සිදු කිරීම.

iii. ඛනිජ පතල් කැණීමේදී සහ එය අලෙවිකරණ අදියර දක්වාම වන සියළු අදාළ ක්‍රියාවලීන් වලදී "ශූන්‍ය අපද්‍රව්‍ය" ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමට උපරිම උත්සහ දැරීම.

iv. ඕනෑම ඛනිජ කැණීමක් සිදු කිරීමෙන් අනතුරුව එම කැණීම සිදු කරන ලද භූමිය නැවත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා පතල් කැණීම්කරු විසින් සිදු කිරීමට සැලසුම් කරන ලද ප්‍රතිසංස්කරණය/ පුනරුත්ථාපනය සැලැස්ම, කැණීම් සැලැස්මේ අත්‍යවශ්‍ය අංගයන් වන අතර එම අදාළ කැණීම සඳහා අදාළ ආයතන මගින් අවසර ලබා දෙන අවස්ථාවේ සිට එම සැලැස්මට අදාළ ක්‍රියාකාරකම් නිසි පරිදි සිදු කරන්නේදැයි අධීක්ෂණය/ ඇගයීම සිදු කළ යුතුය.

v. පාරිසරික බලපෑම් පිළිබඳ විස්තීර්ණ ඇගයීමකින් සහ ඛනිජයේ ආර්ථික ශක්‍යතාව නිසි ලෙස තක්සේරු කිරීමකින් අනතුරුව, අදාළ පරාමිතීන් සහ කොන්දේසි යටතේ අවසර ලබා දෙන ලද සංරක්ෂිත භූමි ප්‍රදේශවල පතල් කැණීම්, පතල් කැණීම් දැඩි අධීක්ෂණයට යටත්ව ක්‍රියාත්මක කිරීම.

vi. ඉහළ ඛනිජ විභවයක් ඇතියැයි භූ විද්‍යාත්මක ක්‍රම මගින් හඳුනා ගන්නා ලද භූමි ප්‍රදේශවල, එම ඛනිජ අවශ්‍ය විටෙක පතල් කැණීම මගින් උකහා ගත හැකි වන පරිදි එම භූමි වල සංවර්ධන කටයුතු

සීමා කළ යුතුය. තවද මෙලෙස හඳුනා ගන්නා ලද ඉහළ ඛනිජ විභවයක් ඇති භූමි අනාගත කැණීම් සඳහා ‘‘ඛනිජ කලාප’’ ලෙස සුරක්ෂණය කළ යුතුය.

(ඇ) පතලක කැණීම් කටයුතු අවසන් වූ විට පතල් කැණීම් ක්‍රියාකාරකම් සිදු කරනු ලැබූ භූමිය/ ප්‍රදේශය, සුදුසු ආකාරයට/ කැණීම් සැලස්මේදී එකඟ වූ පරිදි පතල් කැණීම්කරු විසින් පුනරුත්ථාපනය කරවීමට පතල් කැණීම් සම්බන්ධයෙන් අධිකාරිත්වයක් දරණ රාජ්‍ය ආයතන පියවර ගත යුතුය.

මූලධර්මය 3:

ඛනිජ වලට අගය එකතු කිරීම මගින් සහ ඛනිජ ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම මගින් රජයට ලබා ගත හැකි ආදායම තවදුරටත් වැඩිදියුණු කර ගත හැකිය.

ප්‍රකාශය:

දේශීය ඛනිජ ද්‍රව්‍ය වල පවතින ‘‘නිසග වටිනාකම’’ නිසි පරිදි හඳුනා ගැනීමෙන්, තක්සේරු කිරීමෙන් සහ ඛනිජ භාවිතයෙන් සිදු කළ හැකි නිෂ්පාදන සහ සැකසුම් අවස්ථා හඳුනා ගැනීම මගින්, රටේ ඛනිජ සම්පත් මගින් ඉහළ අදායමක් රටට ලබාගැනීම සඳහා එම ඛනිජ පතල් කැණීම සහ ඛනිජ ආශ්‍රිත නිෂ්පාදන සිදුකිරීම සඳහා සුදුසුකම් සපුරන ලද දේශීය හා විදේශීය ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට කටයුතු කළ යුතුය. එවැනි ආයෝජකයින් සඳහා ආයෝජන මත පදනම් වූ ප්‍රතිලාභ ලබාදීමට රජයේ මුලිකත්වයෙන් කටයුතු සැලසීම තුළින් ආයෝජකයන් දිරිගැන්වෙන අතරම මෙවැනි ඛනිජ ආශ්‍රිත ආයෝජන මගින් රජයට බහුවිධ ආදායම් ලබා ගැනීමට මාර්ගයන් විවෘත වේ.

උපාය මාර්ග:

(අ) ඛනිජ මගින් උපරිම ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා දේශීය ඛනිජවල ආවේණික ‘‘නිසග වටිනාකම’’ හඳුනා ගැනීමත් එම ගුණාංග තක්සේරු කිරීම.

i. දේශීය ඛනිජ ද්‍රව්‍ය වල නිසග වටිනාකම පදනම් කරගනිමින් ශ්‍රී ලාංකික ඛනිජ ද්‍රව්‍ය නිසි පරිදි සහතිකකරණයකට ලක් කිරීම සහ එම නිසග වටිනාකම පදනම් කරගනිමින් එම ඛනිජ සඳහා ජාත්‍යන්තර වෙළඳපොළේ පවතින ඉල්ලුම ප්‍රවර්ධනය කිරීම.

ii. අගය එකතු කළ උසස් තත්ත්වයේ ඛනිජ ද්‍රව්‍ය අපනයනය කිරීමෙන් ඉහළ වෙළෙඳපොළ වටිනාකමක් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතරම සහ දේශීය ඛනිජ සඳහා ගෝලීය වෙළෙඳපොළේ පවතින ඉල්ලුම සම්බන්ධයෙන් වන වෙළඳපල අවස්ථා හඳුනා ගැනීම ඛනිජ බුද්ධි ඒකකයක් මගින් සිදු කළ යුතුය.

iii. රටට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ විස්තීර්ණ සමීක්ෂණයකින් අනතුරුව හඳුනා ගන්නා ලද ගුණාත්මක බවින් ඉහළ ඛනිජ සංචිත, ඛනිජ පිළිබඳව අධිකාරිත්වය ඇති ආයතන මගින් තීරණය කරනු ලබන ප්‍රමුඛතා අනුපිළිවෙලක් යටතේ කැණීම් සිදු කර උකහා ගැනීමට අවස්ථා ලබාදීම.

(ආ) ආයෝජකයින් අතර තරඟකාරී පදනමක් නිර්මාණය කිරීම මගින් ඛනිජ සඳහා අගය එකතු කිරීමේ සම්මතයන් සහ ඛනිජ නිෂ්පාදන ආශ්‍රිත නිර්නායකයන් තීරණය කිරීම.

i. ඛනිජ අපනයන සම්බන්ධයෙන් ප්‍රතිපත්ති තිරණ ගැනීමේදී, ඛනිජ යනු පුනර්ජනනීය නොවන සීමිත සම්පතක් බවත්, ඛනිජ පතල් කැණීමෙන් අනතුරුව එම ඛනිජ අවසන් වන බවත් සහ ඉල්ලුම

තිබෙන කාලයේ ඛනිජ කැණීම් නොකිරීම මගින් එම ඛනිජ සංචිත මගින් ලබාගත් හැකි ආර්ථික ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වන බවත් සැලකිල්ලට ගත යුතුය. එබැවින් ඛනිජ අපනයන් සිදු කිරීමේදී රටෙහි දිගුකාලීන ඛනිජ අවශ්‍යතාය පිළිබඳව සමීක්ෂණයක් සිදු කර දේශීය ඛනිජ අවශ්‍යතාව හඳුනා ගත යුතු අතරම දැනට පවත්වා ගෙන යනු ලබන ඛනිජ ආශ්‍රිත සම්ප්‍රදායික කර්මාන්තවල ඉදිරි පැවැත්මට කිසියම් ආකාරයකින් අහිතකර ලෙස බලපෑමක් නොවිය යුතුය. කිසියම් ඛනිජක් අගය එකතු කිරීමක් නොකර හෝ ඌන අගය එකතු කිරීමක් සහිතව අපනයනය කිරීම මගින් දේශීය ඛනිජ ආශ්‍රිත නිෂ්පාදනයන් සඳහා අහිතකර බලපෑමක් සිදු වන්නේ නම් එම ස්වභාවයෙන් (අගය එකතු කිරීමක් නොකර හෝ ඌන අගය එකතු කිරීමක් සහිතව) එම ඛනිජ අපනයනය කිරීම තහනම් කිරීම.

ii. දේශීය ඛනිජ ආශ්‍රිත කර්මාන්තයක පැවැත්ම සඳහා දේශීයව භාවිතා කරන ලද ඛනිජ ද්‍රව්‍ය වල හිඟයක් ඇතිවුවහොත් එම ඛනිජ ද්‍රව්‍ය ආනයනය සඳහා අවකාශ සලකා බැලිය යුතු අතරම එම ආනයනයෙන් දේශීය ආර්ථිකය සඳහා ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව විස්තීරණ විශ්ලේෂණයක් සිදු කිරීම.

iii. ඛනිජ සඳහා සැලකිය යුතු අගය එකතු කිරීමක් ඇත්නම්, ඛනිජ ද්‍රව්‍ය ආනයනය කර නැවත ප්‍රතිඅපනයනය සඳහා අවස්ථාව ලබා දිය හැකි අතර ඒ සඳහා එම ප්‍රතිඅපනයන ක්‍රියාවලිය නිසාවෙන් රජයට ලැබෙන සමස්ත ලාභය සැලකිල්ලට ගත යුතුය.

iv. දේශීය තත්ත්වයන් යටතේ සහ දැනට රට තුළ පවත්නා තාක්ෂණය භාවිතාවෙන් රට තුළ සිදු කළ හැකි ඛනිජ අගය එකතු කිරීමේ ක්‍රියාවලියන් හඳුනා ගැනීමට සහ ආර්ථික ශක්‍යතාවයක් පවතින ඛනිජ සැකසුම් ශිල්පීය ක්‍රම සොයා ගැනීම ඉලක්ක කරගනිමින් පර්යේෂණ සිදු කිරීමට සහ එවැනි පර්යේෂණ සඳහා දිරි ගැන්වීමට අදාළ ආයතනවල අවධානය යොමු කිරීම.

මූලධර්මය 4:

ඛනිජ පතල් කැණීම් ක්‍රියාවලියේදී පරිසරයට සිදුවන බලපෑම අවම කිරීමට සහ තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාලන ලෙස එම කැණීම් කටයුතු පවත්වාගෙන යෑම සහතික කිරීම.

ප්‍රකාශය:

ඛනිජ පතල් කැණීම් ක්‍රියාවලියේදී මෙන්ම අගය එකතු කිරීමේ ක්‍රියාවලීන් වලදී ද පරිසරයට අහිතකර බලපෑම් සිදුවන බැවින්, ජාතික පාරිසරික පනත (NEA) යටතේ ඇති රෙගුලාසි දැඩි ලෙස පිළිපැදීම ඔස්සේ, එම සියළු ක්‍රියාවලීන් වලදී පරිසරයට ඇතිවන අහිතකර බලපෑම අවම කිරීමට ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගනු ලැබේ. එබැවින්, වඩාත් යෝග්‍ය සහ විශ්වසනීය පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලියක් හරහා, කැණීම් භූමි පුනරුත්ථාපනය, ප්‍රතිෂ්ඨාපනය කාර්යයන් අධික්ෂණය කිරීම සහ කැණීම් සිදු කිරීමේදී පරිසරයට සිදුවිය හැකි අහිතකර බලපෑම් අවම වන ආකාරයට කටයුතු කිරීමටත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.

උපාය මාර්ග:

(අ) ඛනිජ ආශ්‍රිත සියළුම ක්‍රියාකාරකම් (පතල් කැණීම්, ඛණිජ සඳහා අගය එකතු කිරීම සහ ඛණිජ ආශ්‍රිත නිෂ්පාදන වැනි) වලදී පරිසරයට සහ සමාජයට (පුද්ගලයන් සහ දේපළ ඇතුළුව) සිදුවන අහිතකර බලපෑම් වලින් ආරක්ෂා කිරීමට සහ අවම කිරීම සඳහා ඛනිජ ක්ෂේත්‍රයේ නියැලී සිටින පාර්ශවයන් (පුද්ගලික ව්‍යවසායන් සහ රාජ්‍ය ව්‍යවසායන්) කටයුතු කිරීම.

(ආ) ඛනිජ සඳහා අගය එකතු කිරීම මෙන්ම ඛනිජ ආශ්‍රිත ක්‍රියාකාරකම් වලදී ශූන්‍ය අපද්‍රව්‍ය ප්‍රතිපත්තිය ප්‍රවර්ධනය කිරීම.

(ඇ) ඛනිජ ආශ්‍රිත සියළුම ක්‍රියාකාරකම් වලදී සිදුකරනු ලබන සියළු ආකාරයේ පරිසර දූෂණ ක්‍රියා වැළැක්වීම/ අවම කිරීම සඳහා තීරණය කරනු ලබන දඩ මුදල්/ පරිසර අලාභ රජයට ගෙවීමට පරිසරය දූෂණය සිදු කරන පාර්ශවය හට පැවරීම (‘‘දූෂකයා ගෙවයි’’ ප්‍රතිපත්තිය).

(ඈ) ආක්‍රමණශීලී ශාක සහ ජීවී විශේෂ, හානිකර විෂ රසායනික ද්‍රව්‍ය, විකිරණශීලී හෝ වෙනත් ජීව විද්‍යාත්මක, භෞතික හෝ රසායනික ලෙස අපවිත්‍ර වීම වැළක්වීම සඳහා පිළිගත් සම්මත ක්‍රියා පටිපාටියකට අනුව ඛනිජ ආශ්‍රිත ක්‍රියාකාරකම් සිදු කිරීම.

(ඉ) පරිසරය සහ මහජනතාව මත අවම බලපෑමක් ඇතිවන පරිදි පතල් කැණීම් සිදු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණය සහ ක්‍රමවේදයන් භාවිත කිරීම.

(ඊ) පතල් කැණීමේ දී ජාත්‍යන්තරව පිළිගත් සම්මතයන් සහ ප්‍රමිතීන් නිසි පරිදි ක්‍රියාත්මක කිරීම මගින් පතල් සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය මෙන්ම ආරක්ෂාවද තහවුරු කිරීමට කැණීම් පාර්ශවයන් බැඳි සිටියි.

(උ) පාරිසරික සංවේදී ප්‍රදේශවල ආශ්‍රිතව පතල් කැණීම ඇතුළු ඛනිජ ආශ්‍රිත කර්මාන්ත ආරම්භ කිරීමට පෙර අවශ්‍ය සියළුම පූර්ව අනුමැතීන් අදාළ ආයතන මගින් ලබා ගැනීම.

මූලධර්මය 5:

මෙම ජාතික ඛනිජ ප්‍රතිපත්තියේ සඳහන් වන ඉලක්ක සාක්ෂාත් කරගැනීම උදෙසා සහ ප්‍රතිපත්ති අරමුණු ඉටුකරලීම සඳහා පහසුකම් සැලසීම පදනම් කරගනිමින් ඛණිජ ආශ්‍රිත පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම.

ප්‍රකාශය:

ඛනිජ ආශ්‍රිත කර්මාන්ත මගින් ලබා ගත හැකි අදායම් වර්ධනය කිරීම සහ එමගින් මහජනතාවගේ ආර්ථික තත්ත්වය උසස් කිරීම සඳහා හඳුනා ගන්නා ලද ක්‍රියාමාර්ග ලෙස සැලකෙන, ඛනිජ ගවේෂණ ක්‍රමවේද දියුණු කිරීම, කාර්යක්ෂම ඛනිජ කැණීමේ ශිල්ප ක්‍රම හඳුන්වා දීම, ඛනිජ වල අගය එකතු කිරීම සඳහා ප්‍රයෝගික සහ නවෝත්පාදන ක්‍රමෝපායන් නිර්මාණය කිරීම, ඛනිජ ආශ්‍රිත නිෂ්පාදන සංවර්ධනය කිරීම සහ නව නිෂ්පාදන හඳුනා ගැනීම වැනි විෂයන් අරමුණු කර ගනිමින් ඛනිජ ආශ්‍රිත පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම. එවැනි පර්යේෂණ සඳහා ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි ස්ථාපිත විද්‍යාත්මක ආයතන සහ විශ්වවිද්‍යාල අන්‍යෝන්‍ය සහයෝගයෙන් සහ සහභාගිත්වයෙන් කටයුතු කිරීම.

උපාය මාර්ග:

(අ) ඛනිජ ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම සඳහා ප්‍රමුඛතා ලබාදිය යුතු ක්ෂේත්‍ර/ විෂයන් හඳුනා ගැනීම සඳහා වරින් වර ඇගයීම් සිදු කිරීම.

(ආ) රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය යටතේ ක්‍රියාත්මක වන ඛනිජ ආශ්‍රිත කර්මාන්ත මෙන්ම ඛනිජ ආශ්‍රිත ආයෝජන සිදු කර ඇති විදේශීය ආයතන සහ පාර්ශවකරුවන්ගේ අදහස් සහ යෝජනා, ඛනිජ ආශ්‍රිත පර්යේෂණ සහ සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා පර්යේෂකයන් වෙත ලබා දීම.

(ඇ) ඛනිජ ආශ්‍රිත පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කරන අදාළ ආයතන අතර විශේෂඥතාව, තොරතුරු සහ පහසුකම් හුවමාරු කිරීම.

(ඈ) ඛනිජ සහ ඛනිජ පාදක කර්මාන්ත පිළිබඳ වෙළඳපල පර්යේෂණ පුළුල් කරනු ලබන අතර වෙළඳපොළ අවස්ථා හඳුනා ගැනීමට ක්‍රියා කිරීම.

මූලධර්මය 6:

මෙම ජාතික ඛනිජ ප්‍රතිපත්තියේ සඳහන් අරමුණු ඉටුකරලීම සාක්ෂාත් කර ගැනීම සඳහා නීතිමය, පරිපාලන සහ මූල්‍ය සම්මතයන් හඳුන්වා දෙනු ලැබේ.

අරමුණු ප්‍රකාශය:

මෙම ඛනිජ ප්‍රතිපත්තියේ මූලධර්ම සහ අරමුණු සාක්ෂාත් කිරීමට වර්තමානයේ පවතින නීතිමය, පරිපාලන සහ මූල්‍ය රෙගුලාසි ප්‍රමාණවත් නොවන අතර, අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වෙනස්කම් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම.

උපාය මාර්ග:

(අ) මෙම ඛනිජ ප්‍රතිපත්තියේ සඳහන් අරමුණු ක්‍රියාත්මක කරලීම සඳහා දැනට භාවිතාවේ පවතින පනත්, රෙගුලාසි, පරිපාලන ව්‍යුහය සහ මූල්‍ය සම්මතයන් කෙතරම් හොඳින් සහාය දක්වයිද යන්න තීරණය කිරීම සඳහා එම පනත්, රෙගුලාසි, පරිපාලන ව්‍යුහය සහ මූල්‍ය සම්මතයන් පරීක්ෂා කිරීම.

(ආ) අවශ්‍යතාවය පරිදි, මෙම ප්‍රතිපත්ති මූලධර්ම ක්‍රියාත්මක කරන සහ ඒ සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක වෙනස්කම් සිදු කරනු ලබන ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අග්‍රස්ථ ආයතනයක් පිහිටවීම.

(ඇ) රාජ්‍ය සහ අපනයන ආදායම සඳහා සුදුසු ආදායම්/බදු ලබා ගැනීම සඳහා අදාළ බලධාරීන්ගේ සහාය ඇතිව ශක්තිමත් මූල්‍ය යාන්ත්‍රණයක් සකස් කිරීම.

(ඈ) අගය එකතු කළ ඛනිජ නිෂ්පාදනය සඳහා පවතින නීති, විදේශීය හිමිකාරිත්වය සීමා කිරීම් (ඇත්නම්) සහ මෙම ජාතික ඛනිජ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට නීතිමය බාධා ඇත්නම් අදාළ රේඛීය අමාත්‍යාංශය සහ හවුල්කාරී ආයතන විසින් මෙම නීති සමාලෝචනය කිරීම.

මූලධර්මය 7:

ඉඩම් හිමිකම සහ ඛනිජ අයිතිය අතර ඇති අපැහැදිලිතාවය නිරවුල් කිරීම.

ප්‍රකාශය:

ඉඩම් හිමිකම සහ ඛනිජ හිමිකම් අතර ඇති අපැහැදිලිතාවය සහ ඇති වී ඇති/ ඇතිවිය හැකි අර්බුද සඳහා දිගුකාලීන විසඳුමක් ලබාදෙන අතර එම විසඳුම් මගින් ඉඩම් හිමියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන අතරම ඛනිජ ගවේෂණ සඳහා ආයෝජකයන් දිරිමත් කරනු ලබයි. වත්මන් ලෝකයේ භාවිතා වන සම්මතයන්ට අනුකූලව ඛනිජ හිමිකම් සහ ඉඩම් හිමියන්ගේ අයිතිවාසිකම් ශක්තිමත් කිරීම.

උපාය මාර්ග:

(අ) පුද්ගලික ඉඩම් හිමියන්ගේ අයිතීන් සුරකිමින් එම ඉඩම් වල සිදුකරන ඛනිජ ගවේෂණ සඳහා පවතින බාධාවන් ඉවත් කිරීමට කටයුතු කිරීම.

(ආ) ඛනිජ නියාමනය සඳහා පිහිටුවන ලද රාජ්‍ය ආයතන වන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සඳහා වැවිලි ඉඩම් ඇතුළු රජයේ ඉඩම් තුළ පවතින ඛනිජ බහුල ප්‍රදේශ කළමනාකරණය කිරීමට පහසුකම් එම ඉඩම් වල අධිකාරිත්වය දරනු රජයේ ආයතන විසින් සැපයීම.